**ඉතිහාසය - පළමු වාරය - මොඩියුල 1 සහ 2 (සි) - 6 ශ්‍රේණිය**

வரலாறு - முதலாம் தவணை - மொடியூல் 1, 2 (சி) - தரம் 6

**SC06ECIS-2026/315/248,900**


# ඉතිහාසය

## පළමු වාරය

## මොඩියුල 1 සහ 2

## 6 ශ්‍රේණිය




**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව**

**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**ශ්‍රී ලංකාව**

www.nie.ac.lk

**මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

# ඉතිහාසය

පළමු වාරය

# මොඩියුල 1 සහ 2

# 6 ශ්‍රේණිය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය ඃ www.nie.ac.lk



සියලුම මොඩියුල ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.nie.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

ඉතිහාසය - 6 ශ්‍රේණිය

පළමු වාරය ඃ

මොඩියුල - 1

ඉතිහාසය සොයමු

මොඩියුල - 2

ආදි මානවයා

**ප්‍රථම මුද්‍රණය ඃ 2025**

© ජාතික අධ්‍යාපන ආයතනය
සියලු ම හිමිකම් ඇවිරිණි

ප්‍රකාශනය ඃ ජාතික අධ්‍යාපන ආයතනය
ISBN-978-624-5729-98-2

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය ඃ www.nie.ac.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
පිටකෝට්ටේ, පාගොඩ පාර, නො. 110,
සිසාරා ප්‍රින්ට්වේ ප්‍රයිවට් ලිමිටඩ් මඟින්
මුද්‍රණය කරවන ලදී.

Published by : National Institute of Education
Printed by : Sisara Printway (Pvt) Ltd
No. 110, Pagoda Road, Pitakotte.

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සැම ඉගෙනුම්ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත. නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමඟ සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

මහාචාර්ය මංජුලා විතානපතිරණ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.11

# අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

වර්තමානය වන විට ලෝකය ශීඝ්‍ර දියුණුවක් කරා පියනගමින් සිටින්නේ ය. ඒ හා සමගාමී ව පාසල් සිසු සිසුවියන්, නූතන ලෝකයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කරවීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සැමදෙනාගේම පරම වගකීමකි. ඒ අනුව යමින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන විෂයමාලාවට අදාළ මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙසේ හඳුන්වා දීමට අවස්ථාව ලැබීම සුවිශේෂ ජයග්‍රහණයක් බව මෙහිලා උදක්ම සඳහන් කළ යුතු ය.

සෑම විෂයක් සඳහා ම විශේෂයෙන් සකස් කර ඇති මෙම ඉගෙනුම් මොඩියුල, විචාරශීලී චින්තනය මුවහත් කර ගනිමින් සංකීර්ණ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සොයා ගැනීම, විවිධ කෝණවලින් කරුණු විශ්ලේෂණය කිරීම සහ තර්කානුකූල තීරණ ගැනීම ආදි කුසලතා ශක්තිමත් කර ගැනීම විෂයයෙහි මනා පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමි.

ගුණ නැණ සපිරි සිසු පරපුරකගේ සුබ සිහින සැබෑ කරන්නට මෙම ඉගෙනුම් මොඩියුල ආලෝකයක් කර ගන්නා ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි. මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් සම්පාදනය කිරීමේ විශිෂ්ට කාර්යය සඳහා අප්‍රමාණ දායකත්වයක් සැපයූ සියලු දෙනා වෙත මාගේ කෘතවේදී ස්තුතිය ප්‍රකාශ කරමි.

**ඩී. ඒ. සුභාෂිණී දෙමටගොඩ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල.
2025.08.11

# පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනගෙන ඇත. එසේම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සෑම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයක ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයක අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මගපෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර්පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සෑම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සෑම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාව සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අත්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.08

# උපදේශනය, රචනය හා සංස්කරණය

| | |
|---|---|
| උපදේශකත්වය | මහාචාර්ය මංජුලා විතානපතිරණ<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | ආචාර්ය දර්ශන සමරවීර<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| අධීක්ෂණය | ඩී. එච්. චන්දිමා නිශානි ධර්මපාල මිය<br>අධ්‍යක්ෂ<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| සම්බන්ධීකරණය | ඩබ්ලිව්. සමන්ති ශිරෝමාලා ගුණවර්ධන මිය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| රචනය | ඩී. එච්. චන්දිමා නිශානි ධර්මපාල මිය<br>අධ්‍යක්ෂ<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | ඩබ්ලිව්. සමන්ති ශිරෝමාලා ගුණවර්ධන මිය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| සංස්කරණය | |
| | මහාචාර්ය කේ. එම්. රෝහිත දසනායක<br>ඉතිහාස අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. |
| | ආර්. එම්. සතියකුමාර්<br>කථිකාචාර්ය<br>යාපනය විශ්වවිද්‍යාලය |

කේ. වී. එස්. විජයමාලා මිය
ගුරු උපදේශක (විශ්‍රාමික)
කලාප අධ්‍යාපන කාර්යාලය, කැලණිය.

කේ. එස්. රංජනී මිය
ගුරු උපදේශක (විශ්‍රාමික)
කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ.

**භාෂා සංස්කරණය**

නිමල් ප්‍රේමකුමාර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**පරිගණක යතුරු ලියනය**

ඩබ්. ජීවන්ත කුමාර බණ්ඩාර මයා
ග්‍රැෆික් ශිල්පී

**චිත්‍ර ශිල්පී**

පී. ජී. එච්. උදයංගන ගමගේ
ගුරු සේවය
සීතාවක මධ්‍ය මහා විද්‍යාලය, අවිස්සාවේල්ල.

## හැඳින්වීම

ඉතිහාසය යනු ගෙවීගිය කාලයයි. මෙම කාලය තුළ මිනිසා සිය අවශ්‍යතා සපුරා ගැනීමට දැරූ උත්සාහයන් හා ඒවායේ සාර්ථක, අසාර්ථක බව අධ්‍යයනය කිරීම ඉතිහාසය තුළින් සිදුවෙයි. ඒ අනුව මිනිසා පිළිබඳවත්, ඔහු ජීවත්වන සමාජ හා භෞතික පරිසරය සමග ඔහුගේ සම්බන්ධතා අධ්‍යයනය කිරීම ඉතිහාසයට ඇතුළත් වේ. ඉහත තොරතුරු අනුව ඉතිහාසය යනු මිනිසා පිළිබඳ අධ්‍යයනයකි. ඒ තුළින් මිනිසා කාලයත් සමග වෙනස් වෙමින් අත්පත් කරගත් සංවර්ධනය හා එම මානව ක්‍රියාකාරකම් වර්තමානයට හා අනාගතයට බලපා ඇති ආකාරය තේරුම් ගැනීම මෙහිදී අපේක්ෂා කෙරේ.

**ඩී.එච්.චන්දිමා නිශානි ධර්මපාල මිය**
අධ්‍යක්ෂ
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

## මොඩියුලය 1 භාවිතය සඳහා උපදෙස්

මොඩියුල 01 (ඉතිහාසය සොයමු) සඳහා කාලච්ඡේද 12ක් (පැය 10ක) කාලයක් වෙන් කර තිබේ. සම්භාර (credit) ගණන 01යි.

1. කේවල (තනි) හා කණ්ඩායම් ක්‍රියාකාරකම් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් ම සිදු කළ යුතු ය.
2. ක්‍රියාකාරකම් සිදු කිරීමට ප්‍රථම දී ඇති උපදෙස් හොඳින් කියවන්න.
3. ගුරුතුමිය/ගුරුතුමාගේ මගපෙන්වීම හා උපදෙස් අනුව ක්‍රියාකාරකම් සිදු කරන්න.
4. ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පෙර සූදානම් වීම් සිදු කරන්න.
5. මොඩියුලයේ ඇතුළත් ක්‍රියාකාරකම් මගින් ඔබ අඛණ්ඩ ව තක්සේරුවට ලක් කර ලකුණු පිරිනැමීම සිදු කෙරේ. (මේ සඳහා ලකුණු 70ක් ලබා දෙයි)
6. මොඩියුලය අවසානයේ දී සිදු කරනු ලබන ඇගයීම සඳහා ලකුණු 30ක් ලබා දෙයි.

## මොඩියුල අංක 2 භාවිතය සඳහා උපදෙස්

මොඩියුල 02 (ආදි මානවයා) සඳහා කාලච්ඡේද 12ක් (පැය 10ක) කාලයක් වෙන් කර තිබේ. සම්භාර (credit) ගණන 01යි.

1. කේවල (තනි) හා කණ්ඩායම් ක්‍රියාකාරකම් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් ම සිදු කළ යුතු ය.
2. ක්‍රියාකාරකම් සිදු කිරීමට ප්‍රථම දී ඇති උපදෙස් හොඳින් කියවන්න.
3. ගුරුතුමිය/ගුරුතුමාගේ මගපෙන්වීම හා උපදෙස් අනුව ක්‍රියාකාරකම් සිදු කරන්න.
4. ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පෙර සූදානම් වීම් සිදු කරන්න.
5. මොඩියුලයේ ඇතුළත් ක්‍රියාකාරකම් මගින් ඔබ අඛණ්ඩ ව තක්සේරුවට ලක් කර ලකුණු පිරිනැමීම සිදු කෙරේ. (මේ සඳහා ලකුණු 70ක් ලබා දෙයි)
6. මොඩියුලය අවසානයේ දී සිදු කරනු ලබන ඇගයීම සඳහා ලකුණු 30ක් ලබා දෙයි.

# පටුන


පිටු අංකය

**මොඩියුලය - 1**

**01. ඉතිහාසය සොයමු** 1 - 29

හැඳින්වීම 1 - 2

1.1 ඉතිහාසය හඳුනා ගනිමු 3 - 8

1.2 ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන 9 - 15

1.3 මූලාශ්‍රය ඇසුරෙන් තොරතුරු ලබා ගැනීම 16 - 26

1.4 අපේ පාසලේ ඉතිහාසය ගොඩනැගීම 27 - 29

**මොඩියුලය - 2**

**02. ආදි මානවයා** 30 - 79

හැඳින්වීම 31 - 32

2.1 මානවයාගේ පරිණාමය 33 - 44

- මානව පරිණාමයේ ප්‍රධාන අවස්ථා 45 - 55

2.2 මානවයාගේ සොයාගැනීම් 56 - 73

2.3 නූතන මිනිසා (හෝමෝ සාපියන්) 74 - 79



## මොඩියුලය 1

# ඉතිහාසය සොයමු

# ඉතිහාසය සොයමු

ඉතිහාසය යන වචනයේ තේරුම ''එය මෙසේ සිදු විය'' යන්නයි. අතීතයේ සිදු වූ සියලු දෙය අපි ඉතිහාසය ලෙස තේරුම් ගනිමු. එහෙත්, අප ඉතිහාසය ඉගෙන ගැනීමේ දී අතීතයේ සිදු වූ සියල්ල හදාරන්නේ නැත. අතීතයේ සිට අද දක්වා මිනිසාගේ ගමන් මගෙහි සිදු වූ හා ඒවා තීරණාත්මක ලෙස මිනිසාගේ ගමන් මගට බලපා තිබෙන දෑ පමණක් අපි ඉගෙන ගනිමු. අද අප දියුණුවට පත් ව සිටිනුයේ අතීත මිනිසා විසින් සිදු කරන ලද විවිධ ක්‍රියාකාරකම්වල උත්සාහයක ප්‍රතිඵලයක් ලෙසට යි. ඇතැම් විට අසාර්ථක වූ අවස්ථා ද දක්නට ලැබුණ ද ඒවා තුළින් ම සාර්ථක විසඳුම් ඔවුන් සොයා ගෙන තිබේ. අපට ද ඒවා ඉගෙන ගැනීමෙන් වර්තමානය හා අනාගතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය ආදර්ශ ලබා ගත හැකි ය. එවැනි දෑ අපි අතීතයෙන් සොයා බලමු.



## මෙම පාඩම හැදෑරීමෙන් ඔබට...

- ඉතිහාසය යනු කුමක්දැයි වටහා ගැනීමට
- ඉතිහාසයේ කාලය මැන ගැනීම පිළිබඳ අවබෝධ කර ගැනීමට
- ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන මොනවාදැයි දැන ගැනීමට
- ඉතිහාසය ඉගෙන ගන්නේ කෙසේදැයි අවබෝධ කර ගැනීමට
- මූලාශ්‍රය ඇසුරෙන් තොරතුරු සොයා ගැනීමට

**හැකියාව ලැබෙනු ඇත.**





## ක්‍රියාකාරකම - 1.1

## ඉතිහාසය හඳුනා ගනිමු

**අපේක්ෂිත ඉගෙනුම්පල**

- ඉතිහාසය යනු කුමක්දැයි පැහැදිලි කරයි.

**කාලය**

- කාලච්ඡේද 03යි



### මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ

- ඉතිහාසයට අයත් සිදුවීම් ප්‍රකාශ කිරීම
- ඉතිහාසය යනු කුමක්දැයි වටහා ගැනීම
- ඉතිහාසයේ කාලය මැන ගන්නේ කෙසේදැයි විස්තර කිරීම







## පියවර 01 - (ප්‍රවේශය) - මිනිත්තු 50 යි - (ලකුණු 04 යි)

- මුලින් ම පාසලට පැමිණි දිනය ඔබට මතක ද?
- පාසලේ දී පළමුව ඔබ සමග කතා කළ මිතුරිය/ මිතුරා කවුද?
- පාසල් ජීවිතයේ ඔබගේ පළමු ගුරුතුමිය/ගුරුතුමා කවුද?

මේ පිළිබඳ තොරතුරු මතක් කර ගනිමින් ඒවා පන්තියට ඉදිරිපත් කරන්න. ඔබගේ මිතුරු, මිතුරියන් පන්තියට ඉදිරිපත් කරන තොරතුරුවලට සවන් දෙන්න. එම තොරතුරු අනුව ඔබගේ පාසල් ජීවිතයේ මුල් කාලය තව දුරටත් සිහිපත් වනු ඇත.

- මුලින් ම පාසලට පැමිණි දිනයට අමතර ව ඔබගේ පාසල් ජීවිතයේ වෙනත් සිදුවීම් පිළිබඳ මතකයන් මොනවා ද?
- එවැනි සිදුවීමක් පන්තියට ඉදිරිපත් කරන්න.

දුවේ , පුතේ මෙතෙක් සාකච්ඡා කරනු ලැබුවේ ඔබගේ පාසල් ජීවිතය පිළිබඳ ඉතිහාසයයි.

## එසේ නම්, ඉතිහාසය කියන්නේ කුමක් ද? What is History?

ඉතිහාසය යනුවෙන් අදහස් කරන්නේ ගෙවී ගිය කාලයයි. එම ගෙවී ගිය කාලය තුළ මිනිසා කළ, කී දේවල් ඉතිහාසය ලෙස හඳුන්වයි. මෙසේ මිනිසා ඉතා ඈත අතීතයේ සිට වර්තමානය දක්වා සිදු කරන ලද දෑ මිනිසාගේ ඓතිහාසික ගමන් මග වශයෙන් හඳුන්වයි. එම ගෙවී ගිය කාලය තුළ ඉතිරි වී ඇති දෑ ඇසුරෙන් අතීත තොරතුරු සොයා ගනු ලබයි.

## පියවර 02 - ඉතිහාසය හඳුනාගනිමු - මිනිත්තු 50 යි - (ලකුණු 08 යි)




රූපය 1.1.1 කාලයත් සමග වෙනස් වීම්

- රූපය 1.1.1 - ඔබගේ ළඟම මිතුරිය/මිතුරා සමග එක් ව හොඳින් නිරීක්ෂණය කරන්න.

- ඒ අනුව ඔබට හැඟෙන අදහස කරුණු දෙකක් ඇසුරෙන් අභ්‍යාස පොතේ සටහන් කරන්න.

ඔබ දැනගත යුතු විශේෂත්වයක් වන්නේ මේවා සියල්ල මිනිසා විසින් නිර්මාණය කළ ඒවා වීමයි. එනම්, මිනිසා ක්‍රමයෙන් තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා අලුත් දෑ නිර්මාණය කර ගැනීමයි. ඉහත රූපය 1.1.1 සටහනෙහි අතීත මිනිස් ක්‍රියාකාරකම් නිරූපණය කර ඇත. ඒ අනුව ඈත අතීතයේ සිට වර්තමානය දක්වා මිනිසා විසින් නිර්මාණය කරන ලද දේ ඉතිහාසය ලෙස හඳුන්වයි. එම නිසා ඉතිහාසය යනු, මිනිසාගේ කතන්දරය ලෙස ද හඳුන්වයි.



## පියවර 03 - ඉතිහාසයේ කාලය මැන ගැනීම - මිනිත්තු 25 යි - (ලකුණු 06 යි)

- පහත සඳහන් තොරතුරු හොඳින් කියවා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**ඉතිහාසය යනු කාලය හරහා දිව යන ගමනක් ලෙස ද හැඳින්වේ.**

මීට වසර එකොළහකට පෙර ඔබගේ උපත සිදු විය.

මීට වසර හයකට පෙර ඔබ පළමුවන ශ්‍රේණියට ඇතුළත් වී ඇත.

අද දිනය කවදා ද? එය හුණු පුවරුවේ ලියන්න.

අද දිනය තීරණය කළේ කොහොම ද?

දුවේ, පුතේ, ඔබ ඒ සඳහන් කළේ ක්‍රිස්තු වර්ෂ 202.... ...............මස...........දිනයි. අපේ රට ඇතුළු ලෝකයේ බොහෝ රටවල් කාලය මැන ගැනීම සඳහා ක්‍රිස්තු වර්ෂ ක්‍රමය භාවිත කරනු ලබයි.




## ක්‍රිස්තු වර්ෂ - ක්‍රිස්තුස් වහන්සේගේ උපත අනුව ගොඩනැගුණු ක්‍රමයකි




රූපය 1.1.2 - ක්‍රි.ව. ක්‍රමය මගින් කාලය මැනගන්නා ආකාරය

### මෙම ක්‍රමය අනුව

ක්‍රිස්තුස්වහන්සේගේ උපත පළමු වසර ලෙස සලකා උපතට පෙර යුගය
ක්‍රිස්තු පූර්ව ( ක්‍රි.පූ. - **Before Christ- BC** ) ලෙසත්

ක්‍රිස්තු උපතට පසු යුගය
ක්‍රිස්තු වර්ෂ ( ක්‍රි.ව. - **Anno Domini- AD** ) ලෙස හැඳින්වේ.

දුවේ, පුතේ, 1.1.1 රූපය වෙත නැවත ඔබගේ අවධානය යොමු කරන්න. එම රූපයට අනුව අපේ රටේ ඉතිහාසයේ වඩා වැදගත් සිදුවීම් කාලයත් සමග සිදු වූ ආකාරය පෙන්වා දී ඇත. ඒ අනුව

- ක්‍රි.පූ. 4500 දඩයම් යුගය (ක්‍රිස්තු උපතට වසර 4500ට පෙර)
- ක්‍රි.පූ. 400 පැරණි යුගය (ක්‍රිස්තු උපතට වසර 400ට පෙර)
- ක්‍රි.ව. 1500 නූතන යුගය (ක්‍රිස්තු උපතට වසර 1500ට පසු)
- ක්‍රි.ව. 2000 වර්තමානය (ක්‍රිස්තු උපතට වසර 2000ට පසු)

කාලය මැන ගැනීම සඳහා භාවිත කරන ක්‍රිස්තු වර්ෂ ක්‍රමය ලෝකයේ ම පිළිගත් සම්මත ක්‍රමයකි. අපේ රට ඇතුලු ලෝකයේ බොහෝ රටවල මෙම ක්‍රමය භාවිත කරනු ලබයි. මීට අමතර ව විවිධ සිදුවීම් මුල්කර ගනිමින් බුද්ධ වර්ෂ, සක වර්ෂ, හිජ්රි වර්ෂ ආදි වශයෙන් කාලය මැන ගැනීම සඳහා විවිධ වර්ෂ ක්‍රම භාවිත කරයි.

ඒ අනුව පහත සිදුවීම් ක්‍රිස්තුස්වහන්සේගේ උපතට කොපමණ කාලයකට පසු ව සිදු වී දැයි ලියන්න.

1. ඔබේ උපන් දිනය
2. ඔබේ පාසල ආරම්භ කළ දිනය
3. ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු දිනය



## පියවර 04 - ඉතිහාසය යනු - මිනිත්තු 25 යි - (ලකුණු 04 යි)

- ඔබ මෙතෙක් උගත් තොරතුරු ඇසුරින් ඉතිහාසය යනු කුමක්දැයි අභ්‍යාස පොතේ ලියන්න.
- මෙම ක්‍රියාකාරකම ඔබ ආසන්න මිතුරිය/ මිතුරා සමග සාකච්ඡා කර සිදු කරන්න.



# ක්‍රියාකාරකම - 1.2

## ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන

**අපේක්ෂිත ඉගෙනුම්පල**

- ඉතිහාසය ඉගෙනීමේ වටිනාකම් පෙන්වා දෙයි.

**කාලය**

- කාලච්ඡේද 03යි

**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ**

- ඉතිහාසය ගොඩනැගීමේ ප්‍රයෝජන විස්තර කිරීම
- අතීතයෙන් උරුම වී ඇති වටිනාකම් හඳුනා ගැනීම
- අතීතයෙන් වර්තමානයට ගත හැකි ආදර්ශ පෙන්වා දීම





පහත රූපය 1.2.1 හා රූපය 1.2.2 මගින් නිවාස සහ මෝටර් රථ අතීතයේ සිට වර්තමානය වන විට ක්‍රමික ව දියුණුව ගොඩනැගී ඇති ආකාරය නිරූපණය වේ.

- එය හොඳින් නිරීක්ෂණය කර අනාගතයේ නිවාසයක් සහ අනාගතයේ මෝටර් රථයක් නිර්මාණය විය හැකි ආකාරය චිත්‍රයට නගන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.

## පියවර 01 - කාලය සමග වෙනස් වීම - මිනිත්තු 100යි (ලකුණු 20 යි)



1.2.1 රූප සටහන : නිවසේ කතන්දරය



අනාගතයේ හැදෙන නිවස



1.2.2 රූප සටහන : මෝටර් රථයේ කතන්දරය







අනාගතයේ නිර්මාණය වන මෝටර් රථය

## පියවර 02 - ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන - මිනිත්තු 50යි - (ලකුණු 06 යි)

- පහත තොරතුරු හොඳින් කියවා දී ඇති ක්‍රියාකාරකම සම්පූර්ණ කරන්න.

ඉහත ක්‍රියාකාරකමෙන් අනාගත නිවස, අනාගත මෝටර් රථය පිළිබඳ අදහසක් ලබා ගැනීමට ඔබට හැකි ය. එය පින්තූර මගින් ඉදිරිපත් කිරීම නිසා ඒවායේ ආරම්භය, වර්ධනය හා විකාශනය මෙන් ම වර්තමාන තත්වය පිළිබඳ වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම පහසු වී ඇත. ඒ අනුව ඕනෑ ම දෙයක වර්තමානය තේරුම් ගෙන අනාගතය නිවැරදි ව දැකීම සඳහා අතීතය පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ඔබට ඉතිහාසය විෂය ඉගෙන ගැනීමෙන් එනම් අතීතය පිළිබඳ අවබෝධයෙන් වර්තමානය තේරුම් ගෙන අනාගතය දැකීමේ හැකියාව ලබා ගත හැකි ය.

ඉතිහාසය ඉගෙනීමෙන් තමාගේ මාතෘ භූමිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ද හැකි වේ. අපේ අතීත මුතුන් මිත්තන් රටේ සංවර්ධනයට දායක වූ ආකාරය, රටේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කළ ආකාරය, ඔවුන්ගේ විශිෂ්ට නිර්මාණ සහ ඔවුන් අපට දායාද කළ ශ්‍රේෂ්ඨ ගුණාංග ඉතිහාසය විෂය තුළින් විස්තර වේ. ඒ අනුව ඉතිහාසය ඉගෙනීමෙන් අපේ උරුමය හඳුනාගෙන රටට ආදරය කරන පුරවැසියෙකු බිහි කර ගැනීමට හැකිවනු ඇත. සිය දේශයේ සංවර්ධනය උදෙසා නිතැතින් ම කැප වී ක්‍රියා කරනුයේ එවැනි පුරවැසියන් ය.

ඉතිහාසය පුරාවට විස්තර වන්නේ අතීත පාලකයන් ජනතාවගේ යහපත සඳහා ක්‍රියා කළ ආකාරය යි. මේ නිසා ජනතාව ද රජු ආරක්ෂා කිරීමට, රජුට ගෞරව කිරීමට හා රටේ සංවර්ධනය සඳහා කැප වී ක්‍රියා කිරීමට පෙළඹී ඇත. එමෙන් ම රජු රටේ සම්මතයන්ට පටහැනි ව ක්‍රියා කළ විට දී ජනතාව රජුට විරුද්ධ වූ අවස්ථා ද ඉතිහාසයේ දක්නට ලැබේ. ඒ අනුව ඉතිහාසය විෂය හැදෑරීමෙන්, රටේ අනාගත නායකයන්ට ජනහිතකාමී ව රට පාලනය කිරීම සඳහා ආදර්ශ ලබා ගත හැකි ය.

- ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන තුනක් ලියන්න.

1. ..................................................................................................................

2. ..................................................................................................................

3. ..................................................................................................................



# ක්‍රියාකාරකම - 1.3

## මූලාශ්‍රය ඇසුරෙන් තොරතුරු ලබා ගැනීම

**අපේක්ෂිත ඉගෙනුම්පල**

- ඉතිහාසය හැදෑරීම සඳහා උපකාර වන මූලාශ්‍ර හඳුනාගෙන ඒවායින් සාක්ෂි වෙන් කර දක්වයි.

**කාලය**

- කාලච්ඡේද 03 යි

### මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ

- ඉතිහාසය හැදෑරීමට උපකාර වන මූලාශ්‍රය නම් කිරීම
- මූලාශ්‍රයකින් ලබා ගත් තොරතුරු ඉදිරිපත් කිරීම





## පියවර 01 - අතීත තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රය සොයමු. මිනිත්තු 50යි - (ලකුණු 08 යි)

- පහත තොරතුරු හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අතීත තොරතුරු ලබාගන්නා මූලාශ්‍රය

↓ සාහිත්‍යය (විවිධ පොත් පත්)

↓ පුරාවිද්‍යාත්මක (කාසි, සෙල්ලිපි, චිත්‍ර, නටබුන්)

අතීත තොරතුරු සොයාගැනීම සඳහා භාවිත කරන මූලාශ්‍රය ඉහත සටහන පරිදි ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය. ඒ අනුව සාහිත්‍ය මූලාශ්‍රය ලෙස හඳුන්වන්නේ අතීතයේ ලියන ලද විවිධ පොත් පත් ය.

මෙම පොත් මුල් කාලයේ තල කොළවලින් සකසා ගත් පුස්කොළ පොත්වල රචනා කර ඇත. පසු කාලවල දී පොත් පත්වල ලියන ලද දෑ සාහිත්‍ය මූලාශ්‍රවලට අයත් වේ. අපේ රටේ සාහිත්‍ය මූලාශ්‍රය අතරින් වඩාත් ම වැදගත් කෘතිය වන්නේ මහාවංසය යි. එය ක්‍රි.ව. පස්වන සියවසේ මහානාම හිමි විසින් රචනා කර ඇත.

මහානාම හිමියන්ගෙන් පසුව ද එක් එක් කාලයට අදාළ වන පරිදි මහාවංසය අඛණ්ඩ ව රචනා කර ඇත. වර්තමානයේ දී ද මහාවංසය රචනා කිරීම සිදු වෙමින් පවතී. ඒ අනුව අපේ රටේ ශිෂ්ටාචාර ආරම්භ වූ දා සිට වර්තමානය දක්වා අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනගා ගැනීමට මහාවංසය උපකාරී වේ. මෙලෙස අඛණ්ඩ ඉතිහාසයක් රචනා කර ඇති ලෝකයේ රටවල් අතරට ශ්‍රී ලංකාව ද එක් වී ඇත. එම වටිනාකම හේතුවෙන් මහානාම හිමි විසින් රචනා කරන ලද මහාවංසයේ මුල්ම කොටස ලෝක උරුම කෘතියක් ලෙස නම් කර ඇත. එය අපේ රටට ඉමහත් ගෞරවයක් ලබා දෙන කරුණක් ලෙස පෙන්වා දිය හැකි ය.

එමෙන්ම අතීත මිනිසුන් එදිනෙද ජීවිතයේ භාවිත කළ උපකරණ, වාසය කළ ස්ථාන, විවිධ ගොඩනැගිලි, සුසානභූමි ආදි වර්තමානය දක්වා ඉතිරි ව ඇති දෑ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ලෙස හඳුන්වයි. එමගින් අතීතය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට හැකි ය. මෙසේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයාගත හැකි දෑ "මූලාශ්‍රය" ලෙස හඳුන්වයි.



පුස්කොළ පොත්



ශිලා ලිපියක්
(කළු ගල් මත ලියන ලද ලිපි)



අංක 2 ශිව දේවාලය - පොලොන්නරුව



ථූපාරාම පිළිම ගෙය - පොලොන්නරුව



මහ පරාක්‍රමබාහු රජමාළිගය
පොලොන්නරුව



සංකිලි රාජ්‍ය සමයේ මාළිගයක්
යාපනය



පැරණි කාසි

මිහින්තලය පැරණි රෝහලේ නටබුන්

අතීතය පිළිබඳ තොරතුරු සොයා ගත හැකි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය කිහිපයක් ඉහත රූප මගින් පෙන්වා ඇත. වර්තමානය දක්වා ඉතිරි ව ඇති මෙවැනි මූලාශ්‍රය රාශියක් අපේ රටේ පවති යි. එමෙන්ම අතීතය පිළිබඳ තොරතුරු සොයා ගත හැකි වැඩිම මූලාශ්‍රය සංඛ්‍යාවක් පවතින රටවල් අතරට අපේ රට ද අයත් වේ. එවැනි රටක ඔබට වාසය කරන්න ලැබීම ද මහත් වාසනාවකි.

අතීතය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ඇතැම් මූලාශ්‍රය කාලයත් සමග පස් තට්ටුවලින් යට වී ගොස් තිබේ. එවැනි ස්ථාන හඳුනා ගනිමින් කැණීම් සිදු කර පැරණි රාජධානි, ගොඩනැගිලි, පරිහරණය කළ දෑ මෙන් ම අපේ මුතුන් මිත්තන්ගේ චාරිත්‍ර-වාරිත්‍ර පිළිබඳව ද තොරතුරු සොයා ගෙන තිබේ.
මෙම රූපවලින් පෙන්වා දෙන්නේ කාලයත් සමග පස්වලින් වැසී ගොස් තිබුණු අතීතය විස්තර වන මූලාශ්‍රය කැණීම් සිදු කර සොයා ගන්නා ආකාරයයි.



කැණීමකින් සොයා ගන්නා ලද නටබුන්





කැණීම් සිදු කරන අවස්ථාවක්

- සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය 02 බැගින් අභ්‍යාස පොතේ සටහන් කරන්න.
- එය ඔබේ ළඟම මිතුරිය/ මිතුරා සමග සිදු කරන්න.
- ගුරු උපදෙස් අනුව ලකුණු ලබා ගන්න.

## පියවර 02 - මූලාශ්‍රයකින් තොරතුරු ලබා ගැනීම - මිනිත්තු 70යි (ලකුණු 12යි)



දුවේ, පුතේ, දැන් අපි මූලාශ්‍රයකින් තොරතුරු ලබා ගන්නේ කෙසේදැයි සොයා බලමු. මෙය කියවා පහත ක්‍රියාකාරකම සිදු කරන්න. මෙම රූපයෙන් දැක්වෙන්නේ පාහියංගල ගල් ලෙනයි. අදින් වසර හතලිස්දහසකට පමණ පෙර මෙහි මිනිසුන් වසය කර ඇති බවට තොරතුරු ලැබී තිබේ. එකල මිනිසුන් තම නිවහන ලෙස ගල්ගුහා භාවිත කර ඇති බවට මෙය කදිම නිදසුනකි. ඒ අනුව මෙවැනි ගල්ගුහා අපේ රටේ අතීත ජනාවාස පිළිබඳ තොරතුරු සොයා ගත හැකි මූලාශ්‍රයක් ලෙස පෙන්වා දිය හැකි ය.



මෙම රූපයෙන් දැක්වෙන්නේ පොළොන්නරුවේ පිහිටි පරාක්‍රම සමුද්‍රය යි. මෙය අදින් වසර දහසකට පමණ පෙර මහ පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදිකරවන ලද බව සඳහන් වේ. මෙය ඉතා විශාල වැවකි. මෙහි විශාලත්වය නිසා එය සමුද්‍රය ලෙස නම් කර ඇත. කුඹුරු විශාල සංඛ්‍යාවකට මෙමගින් ජලය ලබා ගැනීමට හැකි වී ඇත. අපේ අතීත රජවරු රටේ ආර්ථික සංවර්ධනය සඳහා කටයුතු කළ බව පෙන්වා දීමට මෙය ඉතා උචිත මූලාශ්‍රයකි.



සීගිරියේ අලංකාර උද්‍යානය



සීගිරියේ චිත්‍ර



සීගිරිය ගල මුදුනේ සාදා තිබූ අලංකාර මාලිගය අද දක්නට ලැබෙන ආකාරය



මෙම රූපවලින් පෙනෙන පරිදි සීගිරියේ අලංකාර උද්‍යානයක්, වර්ණවත් චිත්‍ර සහ ගල මුදුනේ ඉතා අලංකාර මාලිගයක් පැවති බවට සාධක දැක ගත හැකි ය. මෙම අලංකාර සීගිරිය නිර්මාණය කරන ලද්දේ පළමුවන කාශ්‍යප රජතුමා විසින් බව මහාවංසයෙහි සඳහන් කර ඇත. ඒ අනුව සීගිරිය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට දැනට ඉතිරි ව ඇති ගොඩනැගිලි, උද්‍යාන, චිත්‍ර සහ මහාවංසය වැනි පැරණි මූලාශ්‍රය උපකාර වේ.

- කොළඹ නගරය දක්වෙන මෙම ඡායාරූප තුන හොඳින් නිරීක්ෂණය කර එහි දක්නට ලැබෙන පොදු ලක්ෂණ දෙකක් සටහන් කරන්න.




1 රූපය - මෙම රූපයෙන් දැක්වෙන්නේ මීට වසර එකසිය විස්සකට පමණ පෙර කොළඹ නගරය යි.



2 රූපය - මෙය මීට වසර හැත්තෑවකට පමණ පෙර කොළඹ නගරය දක්වෙන රූපයකි.




3 රූපය - වර්තමාන කොළඹ නගරය



මෙම ඡායාරූපවලට අනුව කොළඹ නගරය අතීතයේ සිට ජනයාගෙන් පිරී ඇති බව පෙනී යයි. විවිධ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ජනතාව කොළඹ නගරය වෙත පැමිණීම වර්තමානයේ ද සිදුවන්නකි. මෙසේ කොළඹ නගරය අතීතයේ සිට ජනාකීර්ණ වීමට ප්‍රධාන හේතුවක් වූයේ එය අපේ රටේ වෙළෙඳ මධ්‍යස්ථානයක් වීමයි. කොළඹ පිහිටි වරාය නිසා අතීතයේ සිට විදේශිකයන් පවා මෙම නගරයට පැමිණ ඇත. කොළඹ යන නම "කොළ අඹ තොට" යන පදයෙන් බිඳී ආ බව කිය වේ. මෙහි තොට යනුවෙන් හඳුන්වන්නේ වරායට යි. ඒ අනුව මෙම ඡායාරූප මගින් අතීතයේ සිට කොළඹ නගරය ජනාකීර්ණ ව පවතින බව තහවුරු වේ.

ඔබ මෙතෙක් ඉගෙන ගත් තොරතුරු අනුව මූලාශ්‍රය හා එයින් තොරතුරු මතු කර ගැනීම පිළිබඳ අවබෝධයක් ලබන්නට ඇත. ඒ ඇසුරෙන් පහත වගුවේ දැක්වෙන පැරණි මූලාශ්‍රයවලින් හෙළිවන තොරතුරු ඉදිරියෙන් සඳහන් කරන්න. ඔබගේ පිළිතුරු පන්තියේ මිතුරු, මිතුරියන් සමග සාකච්ඡා කර වඩාත් නිවැරදි පිළිතුරු සොයා ගන්න.

| මූලාශ්‍රය | මෙම රූපවලින් දක්නට ලැබෙන දෑ | ඒවායින් හෙළිවන තොරතුරු |
|---|---|---|
|  | | |
|  | | |
|  | | |
|  | | |

## පියවර 03 - නම හැදුණු ආකාරය සෙවීම - මිනිත්තු 30යි - (ලකුණු 04යි)

- ඔබ ජීවත් වන ගම/නගරය/වීදිය සඳහා එම නම හැදුණු ආකාරය ලියන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

- ඒ පිළිබඳ ව ඔබ තොරතුරු සොයාගත් ආකාරය සඳහන් කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................



# ක්‍රියාකාරකම - 1.4

## අපේ පාසලේ ඉතිහාසය ගොඩනැගීම

**අපේක්ෂිත ඉගෙනුම්පල**

- මූලාශ්‍රය ගවේෂණය කර පාසලේ ඉතිහාසය කාලානුරූපී ව ගොඩනගයි

**කාලය**

- කාලච්ඡේද 03යි

## මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ



- පාසලේ ඉතිහාසය සොයා ගැනීමට උපකාර වන මූලාශ්‍රය නම් කිරීම
- පාසලේ ආරම්භය, වර්ධනය හා වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු ප්‍රකාශ කිරීම





## පියවර 01 - අපේ පාසලේ ඉතිහාසය සොයමු - මිනිත්තු 100යි (ලකුණු 20යි)

- පහත සඳහන් කාර්ය පත්‍රිකාවේ ඇතුලත් තොරතුරු ඇසුරෙන් ඔබේ පාසලේ ඉතිහාසය සොයන්න.

**කාර්ය පත්‍රිකාව**

- පාසල ආරම්භ කිරීමට හේතු
- පාසල ආරම්භ කිරීමට දායක වූ පුද්ගලයන්
- ආරම්භක ගොඩනැගිල්ල සහ ගොඩනැගිලි සංඛ්‍යාව වර්ධනය වූ ආකාරය
- ආරම්භක සිසුන් සහ සිසුන් සංඛ්‍යාව වෙනස් වූ ආකාරය
- ආරම්භක ගුරුවරු සහ ගුරුවරු සංඛ්‍යාව වෙනස් වූ ආකාරය

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න. (ගුරුතුමිය/ ගුරුතුමා විසින් ඔබ කණ්ඩායම් කළ ආකාරයට)
- දී ඇති කරුණුවලට අනුව සොයා ගත් තොරතුරු ඇසුරෙන් "අපේ පාසලේ ඉතිහාසය" යන මැයෙන් පාසලේ බිත්ති පුවත්පතට වචන 50ක පමණ ලිපියක් ලියන්න.
- පාසලේ ඉතිහාසය සම්බන්ධ පින්තූර, ඡායාරූප තිබේ නම් ඒවා ද එකතු කර ගනිමින් ලිපිය වඩාත් අලංකාර කර ගන්න.
- එම ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කරන්න.
- ක්‍රියාකාරකම සාර්ථක කර ගැනීම සඳහා කණ්ඩායමේ සියලු දෙනා ම සහය වන්න.



## පියවර 02 - මිනිත්තු 50යි - (ලකුණු 08යි)

01. පාසලේ ඉතිහාසය සොයා ගැනීමට උපකාර වූ මූලාශ්‍රය ලැයිස්තුවක් සකස් කරන්න.

02. එම මූලාශ්‍රය ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| මූලාශ්‍රය | සොයාගත් තොරතුරු |
|---|---|
| උදාහරණ:<br>1. පාසලේ ආරම්භක ගොඩනැගිල්ල | මෙය වසර අසූවක් පමණ පැරණි වේ. ඒ අනුව අපේ පාසල මීට වසර අසූවකට පෙර ආරම්භ කර ඇත. |
| 2. | |
| 3. | |
| 4. | |

## සාරාංශය

**ඉතිහාසය යනු අතීතයේ මිනිසා සිදු කළ දේ පිළිබඳ සොයා බැලීම යි. මූලාශ්‍රය මඟින් අතීතය පිළිබඳ තොරතුරු සොයා ගත හැකි වේ. අතීතයේ මිනිසා විසින් ලියන ලද පොත් පත්, ලිපි ලේඛන, භාවිත කරන ලද උපකරණ, සුසානභූමි, ගොඩනැගිලි ආදී වශයෙන් විවිධ මූලාශ්‍රය පෙන්වා දිය හැකි ය. මෙසේ විවිධ මූලාශ්‍රය භාවිත කරමින් ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගත හැකි ය. මෙම තොරතුරු අධ්‍යයනය කිරීමෙන් අපට අතීතය ඇසුරින් අනාගතය දැකීමට, අතීතයෙන් ආදර්ශ ලබා ගැනීමට හා තම දේශයට ගෞරව දක්වන පුරවැසියෙකු බිහි කර ගැනීමට හැකි වනු ඇත.**



## මොඩියුල 02

# ආදි මානවයා

(ඔස්ට්‍රොලෝපිතිකස් මානවයාගේ සිට

හෝමෝසාපියන් මානවයා බිහි වීම දක්වා)



# ආදි මානවයා



මිනිසා අනෙකුත් සතුන්ගෙන් වෙනස් වන්නේ උසස් මනසක් ඇති නිසා ය. බොහෝ දෑ සිතන්නට වගේ ම නිර්මාණය කරන්නට මිනිසුන් වන ඔබටත් මටත් හැකියාව ඇත. ඒ නිසා අද වන විට මිනිසා පෘථිවි තලයෙන් එහා විශ්වය තරණය කරන්නට තරම් සමත් වී තිබේ. එවැනි විස්මිත දෑ සිදු කරන මිනිසාගේ බිහි වීම කෙසේ සිදු වූවා ද යන්න දැන ගැනීමට ඔබ මහත් කුතුහලයකින් පසුවෙනවා නේද? එසේ නම් දුවේ, පුතේ අපි ආදි මානවයා පාඩමෙන් ඒ පිළිබඳ ව සොයා බලමු.



## මෙම පාඩම හැදෑරීමෙන් පසු ඔබට...

- මූලාශ්‍රය ඇසුරෙන් මානව පරිණාමය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට,
- එක් එක් මානවයන් සතු සුවිශේෂී හැකියා සහ ඒවා මානව ක්‍රියාකාරකම්වලට බලපා ඇති ආකාරය විස්තර කිරීමට,
- මා සතු කුසලතා ඉදිරිපත් කරමින් රටවැසියකු ලෙස අනාගතයට දායකවන ආකාරය පෙන්වා දීමට,
- විවිධ භූගෝලීය කලාපවල ජීවත්වන මානව වර්ග හා ඔවුන්ගේ බාහිර වෙනස්කම් සඳහා බලපා ඇති පාරිසරික සාධක සඳහන් කිරීමට,
- සෑම මිනිසෙකුම එක ම මූලයකින් පැවත එන බව පෙන්වා දීමට,

**හැකියාව ලැබෙනු ඇත.**



## ක්‍රියාකාරකම - 2.1



# මානවයාගේ පරිණාමය

### අපේක්ෂිත ඉගෙනුම්පල

- මූලාශ්‍රය ඇසුරෙන් මානව පරිණාමය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි.

### කාලය

- කාලච්ඡේද 05යි





### මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ

- මානව පරිණාමය පිළිබඳ හැදෑරීමට උපකාර වන මූලාශ්‍රය නම් කිරීම
- මූලාශ්‍රය භාවිත කර මානව පරිණාමය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- මානව පරිණාමයේ ප්‍රධාන අවස්ථා අනුපිළිවෙළින් සකස් කිරීම
- එක් එක් මානවයන් පිළිබඳ තොරතුරු දැන ගැනීම
- කායික වශයෙන් මානවයන්ගේ පරිණාමය හඳුනා ගැනීම
- එක් එක් මානවයන්ගේ ශරීරයේ බාහිර ව දැකිය හැකි වෙනස්කම් දැක්වීම
- මානවයන්ගේ විවිධ හැකියා තීරණය වීමට මොළයේ වර්ධනය අත් හා පාදවල වෙනස්කම් බලපා ඇති ආකාරය පෙන්වා දීම

# පියවර 01 - මිනිත්තු 20යි

## ප්‍රවේශය ▶



1 රූපය



2 රූපය

දුවේ, පුතේ මෙම රූප දෙක හොඳින් නිරීක්ෂණය කරන්න. පළමු රූපය මෙතෙක් සොයාගෙන ඇති ආකාරයට ලෝකයේ බිහිවූ පළමු කාන්තාවගේ රූව වන අතර දෙවන රූපයේ වර්තමාන කාන්තාවකගේ රූවක් දකගත හැකිය. මෙම මුහුණුවල වෙනස බලන්න. එය වසර ලක්ෂ ගණනක් පුරා සිදු වූ කායික පරිණාමයේ ප්‍රතිඵලයකි. මෙම පාඩමෙන් එම වෙනස්කම් සිදු වූ ආකාරය සොයා බලමු.

- පහත සඳහන් රූපසටහන හොඳින් නිරීක්ෂණය කරන්න.
- ඒ පිළිබඳ ව ඔබට හැඟෙන අදහස එක් වැකියකින් ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.



3 රූපය

## සැඟවුණු වැකිය සොයමු

01. ඉහත රූප සටහනෙන් පිළිබිඹුවන අදහස ඇතුළත් වන සේ වැකියක් පහත දී ඇති අඹ ගෙඩියේ සඟවා ඇත. අංක අනුපිළිවෙලින් ගළපා එම සැඟවුණ වැකිය අභ්‍යාස පොතේ ලියන්න.

02. ඔබ ලියන ලද වැකිය හා සැඟවුණු වැකියෙහි අදහස සන්සන්දනය කරමින් ගුරුතුමිය/ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.




පහත දක්වා ඇති ආකාරයට ඔබේ පිළිතුරට අදාල තරු ලකුණු අභ්‍යාස පොතේ අඳින්න.

| ඔබට ඔබව ම අගයන්න අවස්ථාවක් | |
|---|---|
| මම ලියන ලද වැකිය හා සැඟවුණු වැකියේ අදහස නිවැරදි ව ගැළපේ. | ඉතා හොඳයි ★★★ |
| මම ලියන ලද වැකිය හා සැඟවුණු වැකියේ අදහස තරමක් දුරට නිවැරදි ව ගැළපේ. | හොඳයි ★★ |
| මම ලියන ලද වැකිය හා සැඟවුණු වැකිය නිවැරදි ව නො ගැළපේ. | සංවර්ධනය විය යුතුයි ★ |



**පියවර 02 - මූලාශ්‍රය හඳුනා ගනිමු**
**මිනිත්තු 50යි - (ලකුණු 05යි)**

# මානවයා පරිණාමය වූ ආකාරය සොයමු

පහත සඳහන් තොරතුරු හොඳින් කියවා පිටු අංක 40 දී ඇති ක්‍රියාකාරකම සිදු කරන්න.

**මානවයා පරිණාමය වූ ආකාරය සොයා ගන්නේ කෙසේ ද?**

**ඒ සඳහා අපිට භාවිත කළ හැකි දෑ මොනවා ද?**

## මූලාශ්‍රය - sources

මිනිසා බිහි වූයේ අදින් වසර ලක්ෂ ගණනකට පෙර ය. එය සිදු වූයේ කෙසේ ද යන්න පිළිබඳ දැන ගැනීමට අප තුළ මහත් කුතුහලයක් ඇත. මේ නිසා ලෝකයේ බොහෝ රටවල විද්වතුන් මානවයාගේ පරිණාමය පිළිබඳ විවිධ පර්යේෂණ සිදු කර තිබේ.

ආදි මානවයන් ජීවත් වූ ප්‍රදේශ හඳුනාගෙන ඒවායෙහි සිදු කළ පුරාවිද්‍යාත්මක කැනීම් (Archeological Excavation) මගින් බොහෝ සාක්ෂි සොයා ගෙන ඇත. ඒ අතර,

- වසර මිලියන ගණනකට පෙර ජීවත් වූ සතුන්ගේ අස්ථි, විවිධ ශාක අවශේෂ හා සලකුණුවලට අයත් පොසිල
- විවිධ මානවයන්ට අයත් ඇටසැකිලි
- මානවයන් ජීවත් වූ ගල්ගුහා හා එළිමහන් ස්ථාන
- මානවයින් විසින් පරිහරණය කරන ලද විවිධ මෙවලම්
- එම කාලවල ජීවත් වූ සතුන්ගේ අස්ථි කොටස්

ප්‍රධාන වේ.

එකල අකුරු භාවිතය පිළිබඳ තොරතුරු හමු නොවී තිබුණු නිසා පුරාවිද්‍යා පර්යේෂණවලින් සොයාගත්, ඉහත සඳහන් සාක්ෂි පදනම් කරගෙන පසු කාලයේ රචනා කරන ලද විවිධ පොත් පත්, සිතියම්, ඡායාරූප හා චිත්‍ර ආදිය මගින් ද මානවයාගේ පරිණාමය පිළිබඳ තොරතුරු දැන ගැනීමට හැකි වී තිබේ.

# පුරාවිද්‍යා කැණීමක්



## පොසිල Fossil

- පොසිල යනු, අතීතයේ ජීවත් වූ මානවයින්, සතුන් හා ශාක අවශේෂ (ඉතිරි වූ කොටස්) (Remains) හා සලකුණු ය. (Marks)
- සත්ව අස්ථි කොටස්, මලපහ, දත්, ශාකවල හා බීජවල පොතු, සතුන්ගේ පාද හෝ අත්වල සටහන් ආදිය මීට අයත් වේ.
- පොසිල නිර්මාණය වන්නේ, ඉක්මනින් දිරාපත් නොවන ඉහත සඳහන් කළ සත්ව හා ශාක කොටස්වලිනි.
- පොසිලයක් නිර්මාණය වීමට වසර මිලියන ගණනක් ගත වේ.



ආදිතම වානරයාගේ පා සලකුණකි



ආදිතම මානවයෙකුගේ දත්



වඳවී ගිය ඩයිනෝසරයෙකුගේ ඇට සැකිල්ලක්



මුහුදු ජීවියෙකුගේ සැකිල්ලක්



මාළුවෙකුගේ සැකිල්ලක්

## මෙවලම් (Tools)

මෙවලම් යනු, විවිධ කාර්යයන් පහසු කර ගැනීම සඳහා භාවිත කරන ලද උපකරණ වේ. ඒවා නිපදවීමට ශිලා, දැව, මැටි හා ලෝහ භාවිත කර ඇත.



- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- පහත කොටුව තුළ ඇති පින්තූර නිරීක්ෂණය කරන්න.
- එම පින්තූර මානව පරිණාමය පිළිබඳ තොරතුරු ලබා දෙන මූලාශ්‍රය වේ.
- අංක 1 සිට 5 දක්වා පින්තූරවල ඇති මූලාශ්‍රය කුමක් දැයි නම් කරන්න.
- ඔබේ අසල සිටින මිතුරා / මිතුරිය සමග අභ්‍යාස පොත මාරු කර ගන්න.
- ගුරුතුමිය/ ගුරුතුමාගේ පැහැදිලි කිරීම් සමඟ පිළිතුරු පරීක්ෂා කරන්න.
- එක් නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 01 බැගින් මුළු ලකුණු 05යි.
- ලබා දී ඇති කාලය තුළ කාර්යය නිම කරන්න.



01



03



02



04



05

## පියවර 03 - මිනිත්තු 50යි - (ලකුණු 08 යි)

- **මූලාශ්‍රය භාවිත කරමු**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදෙන්න.
- කණ්ඩායම් සඳහා නායකයන් තෝරා ගන්න.
- 01 සිට 04 දක්වා අංක යෙදූ පින්තූර සහ සිතියමක් පහත දක්වා ඇත.
- එම පින්තූර හා සිතියම එකින් එක හොඳින් නිරීක්ෂණය කර ආදි මානවයා පිළිබඳ තොරතුරු දෙක බැගින් ලියන්න.
- ගුරුතුමිය/ ගුරුතුමා පැහැදිලි කිරීම් ඇසුරෙන් පිළිතුරු පරීක්ෂා කර හරි, වැරදි ලකුණු කරන්න.


01


02


03




ආදි මානවයා පිළිබඳ කැණීම් සිදුකළ ස්ථාන

# මානව පරිණාමයේ ප්‍රධාන අවස්ථා



අප්‍රිකාවේ වාසය කළ වානර විශේෂයකින් මිනිසාගේ පරිණාමය සිදු වී ඇති බව සොයාගෙන තිබේ. එහි ආරම්භය අදින් වසර මිලියන තුනකට පමණ පෙර සිදු වී තිබේ.

- දැනට සොයාගෙන ඇති සාක්ෂි අනුව මිනිසා පරිණාමයට පත්වීමේ ප්‍රධාන අවස්ථා පහත A රූප සටහනින් ඉදිරිපත් කර ඇත.
- එම රූපසටහන සහ පහත තොරතුරු හොඳින් අධ්‍යයනය කරන්න. (ඒ සඳහා ඔබට මිනිත්තු 50 ක් හා පියවර ක්‍රියාකාරකම් සඳහා වෙනම කාලයක් හිමි වේ).
- පියවර 4, 5, 6 සහ 7 (පිටු 50 - 55) යටතේ ක්‍රියාකාරකම් සිදු කරන්න. (මේ පිළිබඳ 6 ශ්‍රේණිය ඉතිහාසය වැඩිදුර අධ්‍යයනය මොඩියුලයෙන් ඉගෙනීමට හැකි ය.)



# පරිණාමය (Evolution)



වසර මිලියන ගණනක් පුරා ශාක හා සතුන්ගේ සිදු වන වෙනස්වීමේ ක්‍රියාවලිය පරිණාමය ලෙස හඳුන්වයි. වානර මානවයාගේ (ඔස්ට්‍රොලෝපිතිකස්) සිට නූතන මිනිසා බිහි වීම දක්වා මිනිසාගේ පරිණාමය සිදු වූ ආකාරය මෙයින් විස්තර වේ.



## ඔස්ට්‍රොලෝපිතිකස්

## (Australopithecus)

මානව පරිණාමයේ දී ප්‍රථමයෙන් ම හමුවන මානව ලක්ෂණ සහිත ජීවියා ලෙස සැලකෙන්නේ ඔස්ට්‍රොලෝපිතිකස් ය. මොහු අදින් වසර මිලියන තුනකට පෙර ජීවත් වී ඇත. මෙම මානවයාට අයත් ප්‍රථමයෙන් ම හමු වූ පොසිලය ලුසී යනුවෙන් නම් කර තිබේ. ඇය කාන්තාවක් ලෙස හඳුනාගෙන ඇත.



- මෙම මානවයාට දෙපයින් ඇවිදීමට හැකි ය.
- බහුලව ශාක පත්‍ර හා ගෙඩි වර්ග ආහාරයට ගෙන ඇත.
- පරිසරයේ පැවති ස්වාභාවික රවුම් ගල්, දඬු, මුගුරු, සත්ව ඇටකටු මෙවලම් ලෙස භාවිත කර තිබේ.

ලෝකයේ දනට සොයාගෙන ඇති පැරණිතම පා සටහන මෙය ඔස්ට්‍රොලෝපිතිකස් මානවකයාට අයත් වේ. එය අප්‍රිකාවේ ලැටෝලි නම් ස්ථානයෙන් හමු වී ඇති නිසා ලැටෝලි පිය සටහන් (Leatoli foot print) ලෙස හඳුන්වයි. ගිනි කන්දක අළු මත ඇවිද ගොස් ඇති බැවින් ඒවා පසුව ඝණ වීම නිසා මෙම පියසටහන් අදටත් අපට දක ගැනීමට ඉතිරි වී තිබේ.











## හෝමෝ හැබිලස්

**(Homo Habilis)**

මානව පරිණාමයේ දෙවන අවස්ථාව ලෙස හෝමෝ හැබිලස් හඳුන්වයි. අදින් වසර මිලියන දෙකකට පමණ පෙර ජීවත් වී ඇති මානව වර්ගයකි. මෙවලම් නිපදවීම ආරම්භ කළ නිසා මොහු "හැකි මානවයා" (Handy Man) යනුවෙන් ද හැඳින් වේ.



- ප්‍රථම වරට ගල් මෙවලම් නිපදවීම සිදු විය.
- ශාක හා මස් ආහාරයට ගෙන ඇත.

## හෝමෝ ඉරෙක්ටස්

## (Homo erectus)



මෙය මානව පරිණාමයේ තෙවන අවස්ථාව ලෙස හැඳින්විය හැකි ය. ප්‍රථමයෙන් ම ඍජුව හිටගත් යන අර්ථයෙන් හෝමෝ ඉරෙක්ටස් යන නමින් හඳුන්වා ඇත. මෙම මානව වර්ගයට අයත් සාක්ෂි ජාවා දූපතෙන් හමු වී ඇති නිසා ජාවා මානවයා (Java Man) ලෙස ද චීනයේ පීකිං ප්‍රදේශයෙන් හමුවී ඇති නිසා පීකිං මානවයා (Pikin Man) ලෙස ද හැඳින්වේ. මොහුගේ හස්ත කුසලතා දියුණුවීම නිසා නව සොයාගැනීම් සිදු කර තිබේ.



- ප්‍රථම වරට ගින්දර භාවිත කිරීම.
- දැඩි ලෙස මාංශ ආහාරයට ගැනීම.
- දඩයම සඳහා ගල් මෙවලම් නිපදවීම.
- ශරීරය ආවරණය කර ගැනීමට ගස්වල කොළ හෝ සත්ත්ව හම් භාවිත කිරීම ඔවුන් සතු හැකියා වේ.



## නියාන්ඩතාල්

## (Neanderthal)

නියැන්ඩර් නිම්නයේ සිටි මිනිසා
Human from the Neander Valley

මෙය මානව පරිණාමයේ සිව්වන අවස්ථාව ලෙස සැලකේ. ජර්මනියේ නියාන්ඩතාල් නිම්නයෙන් මෙම මානවයාට අයත් සාක්ෂි ප්‍රථමයෙන් ම සොයා ගත් නිසා නියාන්ඩතාල් මානවයා ලෙස හැඳින්වේ. මෙම මානවයා වැඩි වශයෙන් යුරෝපා ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇත.

- වාසස්ථාන ලෙස ගල් ගුහා භාවිත කිරීම
- ශීත දේශගුණික පරිසරයට හැඩගැසීම
- ලොම් සහිත සතුන්ගේ හම්වලින් සාදාගත් ඇඳුම් භාවිත කිරීම
- මියගිය පුද්ගලයන් වළ දැමීම
- කණ්ඩායම් ලෙස සංවිධානගත වී ජීවත් වීම
- සතුන් දඩයම් කිරීම හා ගින්දර භාවිතය
- ආභරණ පැළඳීම හා සිරුර වර්ණගන්වා (Body Art) අලංකාර කිරීම ඔවුන් සතු හැකියා වෙයි.

## හෝමෝ සාපියන්

**(Homo sapiens)**

ප්‍රඥාවන්ත මිනිසා - Wise man



මොහු නූතන මානවයා ලෙස හැඳින්වේ. මීට වසර ලක්ෂ පහකට පමණ පෙර මෙම මානවයා පරිණාමය වී ඇති බව සොයාගෙන තිබේ. මෙම මානවයාගේ මොළය අනෙකුත් මානවයන්ගේ මොළයට වඩා විශාල ය. මේ නිසා අනෙකුත් මානවයන්ට වඩා හෝමෝ සාපියන් මානවයාගේ සුවිශේෂී හැකියා වර්ධනය විය. යුරෝපා හා ආසියානු ප්‍රදේශවල මොවුන් ව්‍යාප්ත වී ඇත.

- විවිධාකාර මෙවලම් තනා ගැනීම
- වාසස්ථාන සඳහා ගල් ගුහා සහ කුඩාරම් භාවිත කිරීම
- සන්නිවේදනය සඳහා භාෂාවක් භාවිත කිරීම
- ඇදහිලි හා විශ්වාස ක්‍රම අනුගමනය කිරීම
- වර්ණ භාවිත කරමින් සිතුවම් ඇඳීම
- මියගිය පුද්ගලයන් වළ දැමීම
- සතුන් දඩයම් කිරීම හා ගින්දර භාවිත කිරීමට ඔවුන්ට හැකියාව තිබී ඇත.

## පියවර 04 - මිනිත්තු 10යි - (ලකුණු 05)

01. මානව පරිණාමයේ ප්‍රධාන අවස්ථා නිරූපණය වන රූප සටහන් කිහිපයක් පහත දැක්වේ. ඒවා අනුපිළිවෙලින් සකසා රූපයට අදාළ අංකය ලියන්න.

1 - රූපය



2 - රූපය



3 - රූපය



4 - රූපය



5 - රූපය



## පියවර 05 - මිනිත්තු 10යි - (ලකුණු 05 යි)

**ඉහත සඳහන් තොරතුරු හොඳින් කියවා පහත දී ඇති අභ්‍යාසවල යෙදෙන්න.**

02. හිස්තැනට සුදුසු වචනය රවුම තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

මෙවලම්
නියාන්ඩතාල්
පොසිල
ලූසි
පීකිං මානවයා

(i) ඔස්ට්‍රොලෝපිතිකස් මානවයාට අයත් ප්‍රථම වරට සොයාගන්නා ලද පොසිලය ................................. යනුවෙන් නම් කර තිබේ.

(ii) ................................. තනා ගැනීම නිසා ආදි මානවයාට තම කටයුතු පහසු කර ගත හැකි විය.

(iii) හෝමෝ ඉරෙක්ටස් මානවයා ............................... යනුවෙන් ද හඳුන්වයි.

(iv) ශීත දේශගුණික පරිසරයට ඔරොත්තු දෙමින් ...............................මානවයා ජීවත් විය.

(v) ඉක්මනින් දිරාපත් නොවන ශාක හා සත්ත්ව කොටස්වලින් ........................ නිර්මාණය වී ඇත.



## පියවර 06 - මිනිත්තු 10යි - (ලකුණු 05 යි)

03. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය නම් ( ✔ ) ලකුණ ද අසත්‍ය නම් (✕) ලකුණ ද වරහන තුළ යොදන්න.

(i) හෝමෝ හැබිලස් මානවයා හැකි මානවයා ලෙස ද හඳුන්වයි. ☐

(ii) ඔස්ට්‍රොලෝපිතිකස් මානවයාට දෙපයින් ඇවිදීමට හැකි ය. ☐

(iii) ප්‍රථම වරට ගින්දර භාවිතය නියාන්ඩතාල් මානවයාගේ කාලයේ සිදු විය. ☐

(iv) සන්නිවේදනය සඳහා භාෂාවක් භාවිත කළේ හෝමෝ ඉරෙක්ටස් මානවයා ය. ☐

(v) හෝමෝ සාපියන් මානවයාට අයත් සාක්ෂි ජාවා දූපතෙන් සොයා ගෙන ඇත. ☐



මිනිසා පරිණාමය වීම ආරම්භ වූ දා පටන් කායික වශයෙන් විවිධ වෙනස්කම්වලට භාජනය වී ඇත. සමහර වෙනස්කම් මානවයාගෙන් මානවයාට විශේෂ විය. මුහුණ, අත්, පාද, මොළයේ ප්‍රමාණය, ශරීරයේ උස, ආදි වශයෙන් එම කායික වෙනස්කම් දැක ගත හැකි වේ.

**සැලකිය යුතුයි:**
පියවර 07 යටතේ ඇති ක්‍රියාකාරකම සිදු කිරීම සඳහා ඔබේ පාදයක හා අතක වර්ණ තවරා කඩදාසියක පිටපත් කර වියලෙන්නට තබා ගුරුතුමිය/ගුරුතුමා දනුම් දෙන දිනයේ පාසලට රැගෙන එන්න.

## පියවර 07 - මානවයන්ගේ සමානතා හා වෙනස්කම් සොයමු
**මිනිත්තු 50යි - (ලකුණු 12 යි)**

- මෙම ක්‍රියාකාරකම ඔබේ මිතුරු මිතුරියන් සමග සිදු කරන්න.
- ඔබේ කණ්ඩායමට නායකයකු තෝරා ගන්න.
- අංක 1 රූපය හොඳින් නිරීක්ෂණය කර ඒවායේ දැකිය හැකි වෙනස්කම් දෙකක් ලියන්න.
- අංක 2 රූපය හොඳින් නිරීක්ෂණය කර ඒවායේ දැකිය හැකි වෙනස්කම් දෙකක් ලියන්න.
- අංක 3, 4 පින්තූරවල ඇති අත් හා පාද සටහන් හොඳින් නිරීක්ෂණය කර ඔබේ අත් හා පා සටහනට සමාන අත් හා පා සටහන් හඳුනාගෙන නම් කරන්න.
- අංක 3, 4 පින්තූරවල දැකිය හැකි වෙනස්කම් දෙක බැගින් ලියන්න.
- මානවයන්ගේ විවිධ හැකියා සඳහා මොළය, අත් සහ පාදවල වෙනස්කම් බලපා ඇති ආකාරය කණ්ඩායමේ සාකච්ඡා කර පන්තියට කතාවක් ඉදිරිපත් කරන්න.
- අත්වල ඇඟිලි භාවිත කරමින් ඔබට කළ හැකි ක්‍රියාකාරකම් තුනක් සිදු කරන්න.
- ඉදිරිපත් කිරීම්වලින් පසු ව ගුරුතුමිය/ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.




මානව පරිණාමය ආරම්භය හා විකාශනය

02



03




ඔබේ පා සටහන

04




ඔබේ අතෙහි සටහන



## ක්‍රියාකාරකම - 2.2

## මානවයින්ගේ සොයාගැනීම්

**අපේක්ෂිත ඉගෙනුම්පල**

- ආදි මානවයාගේ නව සොයාගැනීම් සමාජ ප්‍රගමනය කෙරෙහි බලපා ඇති ආකාරය පරීක්ෂා කරයි.

**කාලය**

- කාලච්ඡේද 05යි

**මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ**

- එක් එක් මානවයා සතු සුවිශේෂි හැකියා හඳුනා ගැනීම
- මානවයාගේ නව සොයා ගැනීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- එදිනෙදා කටයුතුවල දී මුහුණ දුන් අභියෝග ජයගත් ආකාරය නිදසුන් ඇසුරෙන් විස්තර කිරීම
  - මගේ හැකියා හා දක්ෂතා හඳුනාගෙන ඒවායින් රටේ දියුණු ව වෙනුවෙන් මට කළ හැකි දෑ පිළිබඳ ඉදිරිපත් කිරීම
  - මානව හැකියා සහ සොයා ගැනීම් අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී හා සන්නිවේදන කටයුතු සඳහා භාවිත කරන ආකාරය මගේ අත්දැකීම් ඇසුරින් පෙන්වා දීම.





### පියවර 01 - මානවයන් සතු සුවිශේෂි හැකියා හඳුනාගනිමු - මිනිත්තු 50 යි - (ලකුණු 09යි)

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- එක් එක් මානව වර්ගයා නියෝජනය වන පරිදි සිසුන් කණ්ඩායමක් තෝරාගන්න. (ගැහැණු පිරිමි දෙපාර්ශ්වයම)
- පහත දී ඇති එක් එක් මානවයන්ට අයත් පින්තූර භාවිත කරමින් ඔවුන් සතු සුවිශේෂ හැකියා හඳුනාගන්න.
- එක් එක් මානවයින් කණ්ඩායම පන්තිය ඉදිරියට පැමිණ තමාට කළ හැකි දෑ ඉදිරිපත් කරන්න.
- තමා කුමන මානවයා දැයි සෙසු යහළුවන්ගෙන් විමසන්න.
- නම් කරන ලද මිතුරා / මිතුරිය පිළිතුරු ලබා දෙන්න.
- පිළිතුර වැරදි නම් වෙනත් මිතුරෙකුට / මිතුරියකට අවස්ථාව ලබා දෙන්න.
- පිළිතුරු නිවැරදි නම් 1 රූපය ද වැරදි නම් 2 රූපය ද ප්‍රදර්ශනය කරන්න.



# ඔස්ට්‍රෝලෝපිතිකස්

## මට පුළුවන්























# හෝමෝ හැබිලස්

## මටත් පුළුවන්





## හෝමෝ ඉරෙක්ටස්
(ජාවා මානවයා, පීකිං මානවයා)

**මට තවත් පුළුවන්**











# නියාන්ඩතාල්

**මට ගොඩක් පුළුවන්**













# හෝමෝ සාපියන්

## මට තවත් ගොඩක් පුළුවන්







## පියවර 02 - මට පුළුවන් දේ - මිනිත්තු 50 යි - (ලකුණු 12 යි)




- දුවේ, පුතේ, ඔබේ හැකියා සහ දක්ෂතා පිළිබඳ සිතන්න.
- ඔබ සතු දක්ෂතා දෙකක් සහ ඔබගේ අනාගත බලපොරොත්තුව අභ්‍යාස පොතේ සටහන් කරන්න.
- එම දක්ෂතාවලින් අනාගතයේ දී රටේ සංවර්ධනය වෙනුවෙන් ඔබ සිදු කිරීමට බලාපොරොත්තුවන දේ පිළිබඳ ව කතාවක් පන්තියට ඉදිරිපත් කරන්න.

## පියවර 03 - විවිධ මානව ක්‍රියාකාරකම් - මිනිත්තු 50යි - (ලකුණු 12 යි)

### 1. ප්‍රවේශය ▶

මිනිස්සු විවිධ කාර්යයන් සඳහා ගින්දර භාවිත කරති.

කාර්යයන් පහසු කර ගැනීම සඳහා මිනිස්සු විවිධ උපකරණ (මෙවලම්) සකස් කරති.

- **ඉහත සඳහන් ප්‍රකාශ හොඳින් කියවන්න.**

**එම ප්‍රකාශ පදනම් කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු අභ්‍යාස පොතේ ලියන්න.**

1. එදිනෙදා ජීවිතයේ දී ගින්දර භාවිත කරන අවස්ථා දෙකක් ලියන්න.
2. විවිධ කාර්ය සඳහා භාවිත කරන උපකරණ හතරක් සඳහන් කරන්න.
3. එම එක් එක් උපකරණය භාවිත කර සිදු කරන කාර්යය එක බැගින් ලියන්න.

- **අභ්‍යාස පොත මිතුරිය/මිතුරා සමග මාරු කර ගන්න.**
- **ඔබේ, මිතුරිය/මිතුරාගේ පිළිතුරු පරීක්ෂා කර අදාළ තරු සංඛ්‍යාව අභ්‍යාස පොතේ අඳින්න.**
- **ඔබ සපයන ලද පිළිතුරු ගුරුතුමිය/ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.**

| ඔබව අගයන්න මිතුරිය/මිතුරාට අවස්ථාවක් | |
|---|---|
| පිළිතුරු සියල්ලම නිවැරදි යි. | ඉතා හොඳයි ★★★ |
| පිළිතුරු වැඩි ප්‍රමාණයක් නිවැරදි යි. | හොඳයි ★★ |
| එක් පිළිතුරක් පමණක් නිවැරදි යි. | සංවර්ධනය විය යුතුයි ★ |

## 2. පින්තූර ඇසුරෙන් කතන්දරයක් ගොඩනගමු

- උපකරණ (මෙවලම්) තනා ගැනීම

- ගින්දර භාවිත කිරීම

- යනාදිය මීට වසර ලක්ෂ ගණනකට පෙර සිදු වූ බව ඔබ දැනටමත් ඉගෙන ගෙන ඇත.

01. ආදි මානවයන්ගේ සොයාගැනීම් හා බැඳුණු ක්‍රියාකාරකම් දැක්වෙන පින්තූර පෙළක් පිටු අංක 66 සහ 67 හි දක්වේ. ඒ ඇසුරෙන් පහත ක්‍රියාකාරකම සිදු කරන්න.

02. එම පින්තූර හොඳින් නිරීක්ෂණය කර කතාවක් ගොඩනගන්න. එම කතන්දරය පන්තියට ඉදිරිපත් කරන්න.

03. අනතුරු ව ගුරුතුමිය/ ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.

04. මේ සඳහා ඔබට ලකුණු 12 ක් හිමි වේ.

# ගින්දර නිපදවීම

## මානව ක්‍රියාකාරකම් සඳහා බලපා ඇති ආකාරය...



# මෙවලම් නිපදවීම
## මානව ක්‍රියාකාරකම් සඳහා බලපා ඇති ආකාරය













## පියවර 04 - මිනිත්තු 50 යි - (ලකුණු 7 යි)

පහත දැක්වෙන ගුහා සිතුවම් හොඳින් නිරීක්ෂණය කර දී ඇති ක්‍රියාකාරකම සිදු කරන්න.





අතීත මානවයා ගුහා චිත්‍ර අඳින ආකාරය දැක්වෙන කල්පිත ඡායාරූපයක්

ආදි මානවයන් සතු තවත් සුවිශේෂී හැකියාවක් වූයේ චිත්‍ර ඇඳීම ය. මීට වසර 35000 කට පමණ පෙර ගල් ගුහාවල චිත්‍ර ඇඳ ඇත. ඒවා ගුහා සිතුවම් (cave painting) ලෙස හැඳින්වේ. එදිනෙදා ජීවිතයේ සිදුවීම් මෙම චිත්‍රවලින් පිළිබිඹු වේ. ස්පාඤ්ඤයේ පිහිටි අල්ටමීරා ගුහා සිතුවම් ලොව පැරණිතම ඒවා ලෙස හඳුනාගෙන ඇත. බොහෝ සිතුවම් සඳහා රතු සහ කළු වර්ණ භාවිත කර ඇති අතර ඒවා විශාල ප්‍රමාණයක් ගුහාවේ ගල් බිත්තියේ සහ සිවිලිමෙහි දැකිය හැකි ය.



අන්තර්ජාලය ඇසුරෙන් ගුහා සිතුවම් පිළිබඳ ගවේෂණය කරන්න.



පිවිසුම් දොරටුව




මීටර් 270ක් පමණ දිගින් යුතු අල්ටාමිරා ගුහාවේ ආදි මිනිසුන් විසින් චිත්‍ර ඇඳ ඇති ආකාරය මෙයින් දිස් වේ.

අල්ටාමිරා ගුහාවේ සැලැස්ම



ගුහාවෙහි ඇතුළත



ගුහා සිවිලිමෙහි අඳින ලද සිතුවම්





බයිසන් ගවයාගේ චිත්‍ර වැඩි සංඛ්‍යාවක් සිතුවම් කර ඇති නමුත් ඊට අමතර ව මුවන්, අශ්වයන් වැනි සතුන් ද සිතුවම් කර ඇත. රතු වර්ණයට අමතර ව දුඹුරු වර්ණය ද මෙම චිත්‍ර වර්ණ ගැන්වීම සඳහා යොදා ගෙන තිබේ.



- ගල් ගුහාවල ජීවත් වුණු ආදි මිනිසුන් විසින් අඳින ලද සිතුවම්වලින් ඔබ සිත් ගත් සිතුවමක් තෝරා අඳින්න.
- ඒ සඳහා ගුරුතුමිය/ගුරුතුමාගේ උපදෙස් පිළිපදින්න.

## පියවර 05 - චිත්‍ර අඳිමු - මිනිත්තු 50යි - (ලකුණු 10යි)

**අදහස් ප්‍රකාශ කිරීම හා අදහස් හුවමාරු කර ගැනීම සඳහා මිනිස්සු විවිධ ක්‍රම භාවිත කරති.**

අදහස් ප්‍රකාශ කිරීම හා අදහස් හුවමාරු කර ගැනීම ආරම්භ වීම මීට වසර ලක්ෂ ගණනකට පෙර සිදු වූ බව ඔබ මෙම පාඩමෙන් දැනටමත් ඉගෙන ගෙන ඇත. එම දැනුම පදනම් කර ගනිමින් මෙම ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

**අතීතයේ මෙන් වර්තමානයේ ද විවිධ ස්ථානවල අඳින ලද චිත්‍ර ඔබ දැක ඇත.**

- එවැනි චිත්‍ර හා ඒවා ඇඳ ඇති ස්ථානවලට නිදසුන් තුන බැගින් ලියන්න.
- මෙම ක්‍රියාකාරකම ඔබේ මිතුරියන් /මිතුරන් සමග සිදු කරන්න.
- ඔබ සඳහන් කරන ලද චිත්‍ර පිළිබඳ ව අදහස් ඉදිරිපත් කරමින් ගුරුතුමිය/ ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.
- ගුරුතුමිය/ ගුරුතුමාගේ උපදෙස් අනුව මිතුරන් සමග සාකච්ඡා කර ඔබ කැමති චිත්‍ර ඇඳීම සඳහා සුදුසු මාතෘකාවක් තෝරා ගන්න.

- තෝරාගත් මාතෘකාව යටතේ චිත්‍රය ඇඳ පාට කරන්න.
- ඔබ කණ්ඩායම තෝරාගත් මාතෘකාව චිත්‍රයේ සඳහන් නොකරන්න.
- සියලුම චිත්‍ර ප්‍රදර්ශනය කරන්න.
- ඔබගේ චිත්‍රයෙන් පිළිබිඹු වන අදහස මිතුරන්ගෙන් විමසන්න.
- ඔබගේ නිර්මාණ පාදක කරගනිමින් ගුරුතුමිය/ගුරුතුමා සමග සාකච්ඡා කරන්න.
- චිත්‍ර මගින් පමණක් නොව අදහස් ප්‍රකාශ කිරීම හා හුවමාරු කර ගැනීම සඳහා ඔබට භාවිත කළ හැකි වෙනත් ක්‍රම 3ක් සඳහන් කරන්න.

**සැලකිය යුතුයි:**

ක්‍රියාකාරකම 2.3 හි පියවර 02 යටතේ ඇති තොරතුරු හොඳින් කියවා පිටුපෙරළනය නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ගුරුතුමිය/ගුරුතුමා දැනුම් දෙන දිනයේ දී රැගෙන එන්න.



# ක්‍රියාකාරකම - 2.3

## නූතන මිනිසා (හෝමෝ සාපියන්)

**අපේක්ෂිත ඉගෙනුම්පල**

- මිනිසා එකම මූලයකින් පැවත එන බව හඳුනාගෙන සහජීවනයෙන් කටයුතු කළ හැකි ආකාරය පෙන්වා දෙයි.

**කාලය**

- කාලච්ඡේද 02යි

### මෙම ක්‍රියාකාරකම අවසානයේ දී මා අත්පත් කරගන්නා දෑ

- විවිධ භූගෝලීය කලාපවල ජීවත් වන විවිධ ජාතීන් හඳුනා ගැනීම
- මිනිසුන්ගේ බාහිර වෙනස්කම් සඳහා බලපාන පාරිසරික සාධක සඳහන් කිරීම
- සෑම මිනිසෙක් ම එක ම මූලයකින් පැවත එන බව වටහා ගැනීම





## පියවර 01 - ලෝකයේ ජීවත්වන විවිධ මානව වර්ග - මිනිත්තු 10යි

**ප්‍රවේශය ▶**

- A තීරුවෙන් දැක්වෙන්නේ විවිධ රටවලට අයත් ළමයින්ගේ පින්තූර කිහිපයකි. B තීරුවේ එම ළමයින් අයත් රටවල් නම් කර ඇත. A හා B තීරුව නිවැරදි ව ගළපා රටවල් අනුපිළිවලින් අභ්‍යාස පොතේ ලියන්න.

A



B - ශ්‍රී ලංකාව, චීනය, අප්‍රිකාව, ජර්මනිය

| ඔබට ඔබව ම අගයන්න අවස්ථාවක් | |
|---|---|
| පිළිතුරු සියල්ලම නිවැරදි යි. | ඉතා හොඳයි ★★★ |
| පිළිතුරු වැඩි ප්‍රමාණයක් නිවැරදි යි. | හොඳයි ★★ |
| එක් පිළිතුරක් පමණක් නිවැරදි යි. | සංවර්ධනය විය යුතුයි ★ |

- ඔබේ පිළිතුරට අදාල තරු ලකුණු අභ්‍යාස පොතේ අඳින්න.

## පියවර 02 - මිනිත්තු 90යි - (ලකුණු 10යි)

පහත සඳහන් තොරතුරු හොඳින් කියවා දී ඇති ක්‍රියාකාරකම සිදු කරන්න.

ලෝකයේ ජීවත්වන මිනිසුන් ප්‍රධාන මානව වර්ග හතරකට බෙදා දැක්විය හැකි ය.






## කොකොසොයිඩ්

- සුදුමැලි රතු පැහැ හෝ දුඹුරු පැහැති සමකි
- දුඹුරු වර්ණයෙන් යුතු හිසකෙස්
- ඇස් ලා නිල් හෝ දුඹුරු පැහැයෙන් යුක්ත වේ දිගු නාසයකි.
- මෙම මානව වර්ගය බොහොමයක් යුරෝපා රටවල දැකිය හැකි ය.







## ඔස්ට්‍රොලොයිඩ්

- දුඹුරු හා තද දුඹුරු පැහැයෙන් සමන්විත සමකි.
- දුඹුරු වර්ණ හිසකෙස්
- කළු පැහැති හෝ දුඹුරු පැහැති ඇස්
- මධ්‍යම ප්‍රමාණයේ නාසයක් හා තොල්
- ශ්‍රී ලංකාව ඇතුලු දකුණු ආසියාතික රටවල මෙම මානව වර්ගයට අයත් මිනිස්සු ජීවත් වෙති

## මොංගොලොයිඩ්

- කහ පැහැයට හුරු දුඹුරු පැහැති සමකි.
- දුඹුරු හෝ තද දුඹුරු වර්ණයෙන් යුතු හිසකෙස්
- සිහින් ඇස් හා පළල් මුහුණකින් සමන්විත ය.
- කුඩා නාසයක් හා සිහින් තොල් සගලකි.
- චීනය හා ජපානය යනාදී රටවල ජීවත් වේ.







## නීග්‍රොයිඩ්

- සමෙහි වර්ණය තද කළු හෝ තද දුඹුරු පැහැයකි.
- මුදු ගැසුණු කොණ්ඩය කි.
- මධ්‍යම ප්‍රමාණයෙන් යුතු පැතලි නාසය කි.
- ඇස් දුඹුරු හෝ තද කළු පැහැයට හුරු ය.
- තොල් ඉතා පළල්ව හා විශාලව පිහිටා ඇත.
- මෙම මානව වර්ගයට අයත් පුද්ගලයන් අප්‍රිකානු රටවල ජීවත් වේ.

## පිටුපෙරළනයක් හදමු

ලෝකයේ ජීවත්වන මිනිසුන් අයත් වන ප්‍රධාන මානව වර්ග හතරකි.

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- එක් මානව වර්ගය පිළිබඳ තොරතුරු හා පින්තූර භාවිත කර පිටුපෙරළනයක් සකස් කරන්න.
- පිටුපෙරළනය සැකසීමේ දී ඇතුලත් විය යුතු කරුණු
  - උපරිම පිටු ගණන 08කි.
  - ලෝකයේ ජීවත් වන මානව වර්ග හතර
  - ඔබ සඳහන් කරන මානව වර්ගවලට අයත් පින්තූර
  - එම මානව වර්ගවලට අයත් මිනිසුන් ජීවත්වන රටවල්
  - එක් එක් මානව වර්ගවලට අයත් මිනිසුන්ගේ දැකිය හැකි ලක්ෂණ
  - මිනිසුන්ගේ බාහිර ස්වරූපයෙහි වෙනස්කම් සඳහා බලපෑ පාරිසරික සාධක
- ක්‍රියාකාරකමට අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන එන්න. (A4 සුදු හා වර්ණ, පාට පැන්සල්, ගම්, කතුරු, පින්තූර)
- කණ්ඩායමේ සියලුදෙනාගේ ම සහයෝගයෙන් ක්‍රියාකාරකම සිදු කරන්න.
- ගුරුතුමිය/ගුරුතුමාගේ මගපෙන්වීම යටතේ පිටුපෙරළනය සකස් කරන්න.
- මේ සඳහා ඔබට ලකුණු 10ක් හිමි වේ.

# මිනිසුන්ගේ බාහිර පෙනුමෙහි වෙනස්කම් සඳහා බලපාන හේතු

ලෝකයේ ජීවත්වන මිනිසුන් අතර පෙනුමෙන් වෙනස්කම් දැකිය හැකිය. ඒ සඳහා ඔවුන් ජීවත් වන ප්‍රදේශය, රට, මහද්වීපයෙහි ඇති,

- උෂ්ණාධික
- ශීතාධික
- සම සීතෝෂ්ණ
- කඳු
- තැනිතලා
- කාන්තාර

යන පාරිසරික හා දේශගුණික සාධක බලපා ඇත. එබැවින් එකම මූලයකින් පැවත එන මිනිසා, පාරිසරික හා දේශගුණික සාධක මත කායික වෙනස්කම්වලින් යුක්ත වෙයි. එලෙස වෙනස්කම් පැවතිය ද පහත දැක්වෙන ආකාරයට සෑම මිනිසෙක් ම එකම මූලයකින් පැවත එන බැවින් අපි සියල්ලෝම එක සමාන වෙමු. එකිනෙකාට ගරු කරමු.

